# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/ 146 /2018 (NPC)

එච්.ඩී.ටී.යූ.ජයසේකර,
**අභියාචක**
**එදිරිව**
ජාතික පොලිස් කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.03.11**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක පෞද්ගලිකව පෙනී සිටී.
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්‍ෂක මාලා බස්නායක මහත්මිය.

**-නියෝගය-**

## ජේ.ජේ.රත්නසිරි මැතිතුමා (සාමාජික) පරි.අභි.විනි. අධිකාරය

අභියාචක 1990.10.07 දින උපසේවා උප පොලිස් පරීක්‍ෂක ලෙස සේවයට එක්වී ඇත. 1998.04.16 දින උපසේවා පොලිස් පරීක්‍ෂක තනතුරට උසස් වී ඇත. පසුව උප සේවා නිලධාරීන් නිත්‍ය සේවයට අන්තර්ග්‍රහණය වීමේ ක්‍රමවේදය යටතේ 1999.06.13 දින නිත්‍ය සේවයේ උපපොලිස් පරීක්‍ෂකයෙකු ලෙසද, 2006.02.01 දින පොලිස් පරීක්‍ෂක තනතුරට ද උසස්වීම් ලබා ඇත. ඉන් පසුව 2019.07.01 දින සිට ප්‍රධාන පොලිස් පරීක්‍ෂක තනතුරට උසස්වීම් ලබා ඇත. අභියාචකගේ ඉල්ලීම වන්නේ, 2019.07.01 දිනට තමාට ලැබුණ ප්‍රධාන පොලිස් පරීක්‍ෂක තනතුර, 2015.03.19 දිනට පෙරදාතම් කර දෙන ලෙසයි. මේ පිළිබඳව ඉල්ලීමක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති අතර, පසුව ඒ ඉල්ලීම ජාතික පොලිස් කොමිෂන් සභාවට යොමු කර ඇත. ජාතික පොලිස්

කොමිෂම විසින් අදාළ ඉල්ලීම 2018.06.20 දින ප්‍රතික්ෂේප කර ඇත. අදාළ තීරණයෙන් තෘප්තිමත් නොවූ අභියාචක මෙම විනිශ්චය අධිකාරයට 2018.08.09 දින අභියාචනයක් ඉදිරිපත් කරමින් ඉල්ලා සිටින්නේ,

I. එම කරුණු සොයා බැලීමට මාගේ මේ අභියාචනය 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරී පනතේ ප්‍රතිපාදන යටතේ විභාගයට ගන්නා ලෙසත්,

II. අවශ්‍ය ආයතන හා තැනැත්තන් වෙත මෙම කරුණු සළකා බැලීම සඳහා අවශ්‍ය කැඳවීම් සිදුකිරීමට කාරුණික අවධානය යොමු කරන ලෙසත්,

III. එම විභාගයේ දී තව දුරටත් අවශ්‍ය කරනු ලබන විස්තර සහිත ලේඛන කරුණු ඉදිරිපත් කිරීමට මා හට අවස්ථාවක් ලබාදෙන ලෙසත්,

IV. සාධාරණ කරුණු විනිශ්චය සභාව මගින් තීරණය කර මා හට 2015.03.19 වන දිනට පෙරදාතම් කර නිසි ජ්‍යෙෂ්ඨත්වයේ බල පැවැත්වෙන පරිදි වැටුප් තලයෙහි පිහිටුවා හිඟ වැටුප් සහ හිඟ දීමනා සමඟ ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට උසස් කිරීමට අවශ්‍ය නියෝගයක් නිකුත් කිරීමට කටයුතු කරන ලෙසත්,

අභියාචක අදාළ ඉල්ලීම සනාථ කිරීම සඳහා ඇමුණුම් රැසක් ඉදිරිපත් කර ඇත. එසේම අභියාචක අවස්ථා කිහිපයකදී තම ඉල්ලීම සනාථ කිරීම සඳහා තොරතුරු ඉදිරිපත් කර සිටී.

1. **2028.08.09** අභියාචනය සමඟ ඇමුණුම් රැසක්,
2. **2020.12.25** - නිරීක්ෂණ
3. **2022.08.04** – නිරීක්ෂණ හා ඇමුණුම්
4. **2025.07.20** –
5. **2025.08.25** -
6. **2025.10.20** ලෙස විවිධ අවස්ථාවල කරුණු ඉදිරිපත් කර සිටී. එසේම මේ තොරතුරු වලට අමතරව විවෘත අධිකරණයේ දී වාචික පැහැදිලි කිරීම් ද සිදුකරන ලදි. මෙම සියළු නිරීක්ෂණ සහා ඇමුණුම් වල සඳහන් කරුණු මෙන්ම වාචකව කරුණු දැක්වීම් අනුව අභියාචක දන්වා සිටින්නේ,

A. 2015.03.19 දිනට ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරු ලබා දීමේ දී ඒ අවස්ථාවේ පැවති සියළු සුදුසුකම් තමා සපුරා තිබූ බව,

B. අදාළ සම්මුඛ පරීක්ෂණයේ කඩඉම් ලකුණු වන 72.25 වන අතර, තමා ලකුණු 72.5 ලබා තිබූ බව,

C. එයට අමතර ලබා දෙන ලකුණු 7.5 එකතු කළ විට තමාට ලකුණු 80 වැනි ඉහළ ලකුණු ප්‍රමාණයක් ලැබිය යුතු බව,

D. තමාට විනය පරීක්ෂණ 02 තිබුණත්, අදාළ චක්‍රලේඛන වලට අනුව ඒ කාලය බැහැර කළ හැකි බව,

E. තමා සියළු වැටුප් වර්ධක උපයා ගෙන සිටි බව,

F. පොලිස්පති විසින් ප්‍රසිද්ධ කරන ලද ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුර සඳහා සුදුසුකම් සඳහන් දැන්වීමේ වසර 05ක නොකැළැල් සේවා කාලයක් සඳහන් කර තිබීම නිත්‍යානුකූල නොවන බව,

G. වෙනත් අවස්ථා වලදී එය වසර 03 ලෙස සඳහන් වී ඇති බව,

H. කාර්ය පටිපාටික රීති 186 අනුව තමා අදාළ සුදුසුකම් සපුරා ඇති බව,

I. තමා වසර 35 කට ආසන්න අඛණ්ඩ සේවා කාලයක් සහිතව, සාදු සටහන් 500 කට නොඅඩු ප්‍රමාණයක් ලබා, පොලිස්පති ප්‍රසංශා ලබා තිබූ බව,

මෙම සියළු කරුණු කෙරේ මෙම අධිකාරයේ අවධානය යොමු කළ අතර, මේ සඳහා ප්‍රතිඋත්තර ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා ජාතික පොලිස් කොමිෂන් සභාව ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ කෙරේ ද අවධානය යොමු කරන ලදි.

1. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් 2018.10.22 දින තම නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.
2. එසේම 2019.09.23 දින නිරීක්ෂණ සහ ඇමුණුම් දෙකක් ඉදිරිපත් කර ඇත.
3. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2021.11.12 දින තම නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.

ජාතික පොලිස් කොමිෂන් සභාව, 2018.10.22 දින ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ වාර්තාවේ,

**06.** ඒ අනුව 2015.03.19 දිනට ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට උසස්වීම් ලබා දීමේ දී සතුටුදායක සේවා කාලයක් ලෙස සළකා බැලූ 2009.12.05 දින සිට 2014.12.05 දින දක්වා වූ වසර 05ක කාලය තුළ නිලධාරියා විසින් ඉහත දක්වා ඇති වැරදි සිදුකර ඊට අදාළ විනය නියෝගය ලබා ඇති බැවින්, ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරේ උසස්වීම් ලබාදීම සඳහා සුදුසුකම් ලබා නොමැති බැවින්, 2015.03.19 දිනට අදාළ ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරේ උසස්වීම් ලැබී නොමැත. ඒ බව 2018.07.12 දිනැතිව අභියාචක වෙත දන්වා යවා ඇත. (ඇමුණුම් 3)

II කරුණ,

පොලිස්පති චක්‍රලේඛ 2269/2011 අනුව සතුටුදායක සේවා කාලය දෙවන උප ලේඛනයේ වසර 01 ලෙස ගණනය කළ යුතු බව,

අභියාචක ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට උසස්වීමට අදාළ අයදුම්පත් කැඳවීමේ දී සළකා බලන ලද මූලික සුදුසුකම් සපුරා නොමැති අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සහ බලතල පැවරීමේ

විධිවිධාන පිළිබඳව අර්ථකථන ඉදිරිපත් කර ඇති මුත් ඒ සියළු කරුණු පදනම් විරහිත බව ජාතික පොලිස් කොමිෂන් සභාව නිරීක්ෂණය කෙරේ.

යනුවෙන් දක්වා ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද 2021.11.12 නිරීක්ෂණ වෙතද අවධානය යොමු කරන ලදි. එම ලිපියේ

05. සේවා කාලය හා කුසලතාවය මත ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට උසස්වීම් ලබාදීම සඳහා පහත සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා ඇත.

- 2014.12.05 දිනට පොලිස් පරීක්ෂක තනතුරේ වසර 08ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කිරීම හා පොලිස් පරීක්ෂක තනතුරේ ස්ථිර කර තිබීම,
- අයදුම්පත් කැඳවන අවසන් දිනය වන 2014.12.05 දිනට පෙර වසර 05ක සතුටුදායක සේවා කාලයක් තිබීම.

06. අභියාචක ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරේ උසස්වීම් සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීම හේතුවෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත කැඳවා ඇති අතර, 2015.03.19 දිනට ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට උසස්වීම් ලබා දීමේ දී සතුටුදායක සේවා කාලයක් සළකා බැලූ 2014.12.05 දිනට පෙර වසර 05 තුළ දී මෙම නිලධාරියා වෙත ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 24:2 ප්‍රකාරව දෙවන උපලේඛනය යටතේ පහත සඳහන් විනය නියෝග ලබා දීම මත 2015.03.19 දිනට ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරේ උසස්වීම් ලැබීම සඳහා සුදුසුකම් ලබා නොමැති බව දන්වා ඇත.

- අභියාචක 2010.05.13 දින සිදුකරන ලද වරදකට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මධ්‍යම පළාත විසින් අංක S/DIG/CP/HC/306/12 යටතේ චෝදනා පත්‍රයක් ලබාදී එහි විනය නියෝගය ලෙස 2010.05.13 දිනට පසුව එළඹෙන වැටුප් වර්ධකය එක් වසරකට අත්හිටුවීම
- අභියාචක 2010.05.03 දින සිට 2010.06.03 දින දක්වා වූ කාලය තුළදී සිදුකරන ලද වරදකට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මධ්‍යම පළාත විසින් අංක S/DIG/CP/HC/308/12 යටතේ චෝදනා පත්‍රයක් ලබාදී එහි විනය නියෝගය ලෙස 2012.02.01 දිනට පසුව එළඹෙන වැටුප් වර්ධකය එක් වසරකට අත්හිටුවීම

**07.** අංක 2269/2011 හා **2011.03.26** දිනැති පොලිස්පති චක්‍රලේඛය අනුව උසස් කිරීම් වලදී සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේ දී දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටදී, වරද සිදුකරනු ලැබූ දින සිට වසර එකක (වසර 01) කාලයක් ගණනය කළ යුතු බවට විධිවිධාන පනවා ඇති අතර, එම චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන නිවැරදිව අවබෝධ කර නොගැනීම මත මෙම අභියාචනය නැවත ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ. මෙම චක්‍රලේඛනය මගින් යම් නිලධාරියෙකුගේ සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේ දී පාදක කරගත යුතු මූලික කරුණු වෙනස් වී නොමැති අතර, ඒ අනුව යම් නිලධාරියෙකුගේ සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේ දී ඔහු අදාළ කාලය තුළ විනය දඬුවම් ලබා නොතිබීම යන මූලික අවශ්‍යතාවය සපුරා තිබිය යුතු බව කාරුණිකව දන්වමි.

**08.** එබැවින් අභියාචක විසින් දන්වා ඇති පරිදි කුසලතාවය මත ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුර සඳහා උසස්වීම පිණිස සුදුසුකම් සළකා බලා ඇති **2014.12.05** දිනට, "**පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම**" යන මූලික අවශ්‍යතාවය සපුරා නොතිබීම මත ඔහු එම තනතුර සඳහා සුදුසුකම් ලබා නොමැති බව කාරුණිකව දන්වන අතර, යථෝක්ත කරුණු පරිපාලන අභියාචන විනිශ්වය අධිකාරය වෙත ඉදිරිපත් කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

ඉහත සඳහන් දෙපාර්ශවයම ඉදිරිපත් කරන ලද කරුණු කෙරේ ගැඹුරින් අවධානය යොමු කරන ලදි. ඒ අනුව අභියාචක සඳහන් කරන පරිදි **2014.05.15** අනුව පෙර වසර **05**ක පූර්ව සේවා කාලය කිසිදු දඬුවමකට, විනය පරීක්ෂණයකට භාජනය නොවී සිටීම යහපත් හැසිරීම් කාලයක් ලෙස සළකා කටයුතු කළ හැක. එමෙන්ම ඒ කාලය තුළ විනය පරීක්ෂණයකට ලක්වී, කිසිදු දඬුවමක් නොලබා, සියළු චෝදනා වලින් නිදොස් කර නිදහස් කර ඇත්නම් ඒ පිළිබඳවද සළකා බැලිය හැක. එසේ වුවත් අභියාචක අදාළ කාලය තුළ දෙවතාවක් වැටුප් වර්ධක අත්හිටුවීමේ දඬුවමට ලක්වී ඇත. ඒ අනුව මෙම කාලය නිකැළැල් සේවා කාලයක් ලෙස සැළකීම අපහසු බව මෙම විනිශ්වය අධිකාරයේ මතය වේ. ඒ අනුව ජාතික පොලිස්

කොමිෂන් සභාව ලබා දී ඇති තීරණයෙහි වැරද්දක් පෙනෙන්නට නැත. ඒ අනුව අභියාචනය නිශ්ප්‍රභ කිරීමට තීරණය කරමු.

අදාළ තීරණය අභියාචක, ලේකම්, ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත දන්වන්න.

අභියාචනය නිශ්ප්‍රභ කරමු.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-